රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:319

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1985 දෙසැම්බර් මස 20 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ස්වේච්ඡා බලකායෙහි සක්‍රීය සේවය සඳහා යොදවනු ලබන රාජ්‍ය නිලධාරීන්, පලාත් පාලන සේවකයන් සහ රාජ්‍ය සංස්ථා සේවකයන් සඳහා වැටුප් හා දීමනා ගෙවීම**

ස්වේච්ඡා බලකායෙහි සක්‍රීය සේවය සඳහා යොදවාගනු ලබන/කැඳවනු ලබන රාජ්‍ය නිලධාරීන්/පලාත් පාලන සහ රාජ්‍ය සංස්ථා සේවකයන් (අනියම් නිලධාරීන්/සේවකයන් හැර) සඳහා වැටුප් හා දීමනා ගෙවීම සඳහා පහත සඳහන් රීති අදාල වනු ඇත.

02.

(අ) හිමිකම

සක්‍රීය සේවයේ මුල් දින 60 සඳහා:

සාමාන්‍ය සිවිල් වැටුප සහ ජීවන වියදම් දීමනාව සහ, ඊට අමතරව, ජීවන වියදම් දීමනාව හැර, පදවිය අනුව යුද්ධ හමුදා වැටුප සහ යුද්ධ හමුදා දීමනා.

(ආ) මුල් දින 60 න් ඔබ්බට:

සාමාන්‍ය සිවිල් වැටුප සහ ජීවන වියදම් දීමනාව හෝ යුද්ධ හමුදා වැටුප සහ ජීවන වියදම් දීමනා සමග යුද්ධ හමුදා දීමනා යන දෙකෙන් වැඩි ප්‍රමාණය.

සටහන (1) යටත්පිරිසෙයින් මාස හයක විරාමයකින් පසුව සක්‍රීය සේවය සඳහා නැවත කැඳවන්නේ නම් වැටුප් රහිත අනිවාර්ය නිවාඩුවෙන් නැවත කැඳවනු ලබන ස්වේච්ඡා පුද්ගලයින් හට ඉහත (අ) හි සඳහන් වැටුප් ගෙවිය යුතුය.

සටහන (2) ස්වේච්ඡා හමුදා පුද්ගලයින්ට ආහාර සැපයීම නිසා ජීවන වියදම් දීමනාවෙන් අඩුකිරීමක් නොකල යුතුය.

03. ගෙවීම් බලධරයා

(අ) සිවිල් වැටුප සහ දීමනාව මුල් දවස් 60 න් ඔබ්බට ද ගෙවීම සිවිල් බලධාරීන් කරනු ඇත.

(ආ) යුද්ධ හමුදා වැටුප සහ දීමනාව වඩා වැඩිනම් වෙනස පමණක් සන්නද්ධ සේවාවන් ගෙවනු ඇත.

(ඇ) දින 60 න් ඔබ්බට සේවයේ යෙදවූ කාලසීමාවන් සඳහා සිවිල් බලධාරීන් කරන ගෙවීම් සන්නද්ධ සේවා බලධාරීන් ඔවුන්ට ආපසු ගෙවනු ඇත.

.... 2පිටුව

04. 1966 ජනවාරි මස 27 දින අංක.35 සහ 1978 ඔක්තෝබර් මස 5 දින අංක.274 දරණ ආයතන චක්‍රලේඛ ලිපි මෙයින් අවලංගු කෙරේ.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.